පුනරීක්ෂණ අභ්‍යාස

1. ගැබිණි මවක් සඳහා ෆෝලික් අම්ලය අත්‍යවශ්‍ය වන්නේ ඇයි?
2. අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සීමිත සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීමේදී අනුගමනය කරන ක්‍රියාවලිය කුමන නමකින් හැඳින්වේද?
3. ඔබ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිළිවෙත් නම් කරන්න.
4. ගෘහීය කළමනාකරණයෙන් ලැබෙන වාසි 03ක් ලියන්න.
5. කාර්ය සටහනක් යනු කුමක්ද?
6. කාර්ය සටහනක් සැලසුම් කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු 03 ලියන්න.
7. A හා B තීරු නිවැරදිව යා කරන්න.
8. ශ්‍රමය — 1. කාල සටහන
9. මුදල් — 2. ශ්‍රම සටහන (ශ්‍රම විභජන සටහන)
10. කාලය — 3. අයවැය ලේඛනය
11. දෛනික කාර්යයන් වල කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා කාලය සැලසුම් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු 04 ක් ලියන්න.
12. ශ්‍රම විභජන සටහන පැහැදිලි කරන්න?
13. ශ්‍රම විභජන සැලැස්මක් පිළිලෙ කිරීමේදී ගෘහනිය විසින් අවධානය යොමු කළ යුතු කරුණු 03 ක් ලියා දක්වන්න.
14. නිවසේ කටයුතු සාමාජිකයන් අතර බෙදීයාමෙන් අත්වෙන වාසි 03ක් දක්වන්න.
15. පවුලේ සියලු ආදායම්, වියදම් පිළිබඳ තුලනාත්මක සටහන කුමන නමකින් හඳුන්වයිද?
16. අයවැය ලේඛනයක ඇතුළත් විය යුතු වියදම්(වැය ශීර්ෂ) ශීර්ෂ මොනවාද?
17. ගෘහයක අයවැය ලේඛනයක් සකස් කිරීමෙන් නිවසියන්ට ලැබෙන වාසි මොනවාද?
18. විශේෂ උත්සව අවස්ථාවන් සඳහා ආහාර පිළිගැන්වීමෙන් ඔබට අත්වන වාසි මොනවාද?